**කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# ප්‍රසම්පාදන දැන්වීමයි

## ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින්ගේ ගමන් බලපත්‍ර (passport) වලට ඇලවීම සඳහා ආරක්ෂිත මුද්දර මුද්‍රණය කර සැපයීම

## PR/02/02-24(II)

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ පාලනය වන 1985 අංක 21 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපිත රාජ්‍ය ආයතනයකි.

ඉහත සඳහන් ප්‍රසම්පාදන කටයුත්ත සඳහා ජාතික තරගකාරී ලංසු ක්‍රමය මගින්, 2023.12.06 දින පෙ.ව 11.00 දක්වා මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

ආපසු නොගෙවනු ලබන රු. 5,000/= ක තැන්පතු මුදලක් කාර්යාංශයේ මුදල් අයකැමි වෙත මුදලින් ගෙවා, ලංසු ඉදිරිපත් කරනු ලබන ආයතනයෙන් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් සමග ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල් පිටපතක් හෝ සහතික කළ පිටපතක් සහ ඡායා පිටපතක් ඉදිරිපත් කර 2023.11.13 දින සිට 2023.12.04 දින දක්වා කාර්යාල දිනයන්හි පෙ.ව. 09.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ, ප්‍රසම්පාදන අංශය වෙතින් ලංසු ආකෘති පත්‍ර ලබාගත හැකි අතර, එම ආකෘති පත්‍ර පුරවා පිටපත් දෙකකින් යුක්තව මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

ලංසුපත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආරක්ෂිත මුද්දර මුද්‍රණය කිරීම" යනුවෙන් සඳහන් කර පහත සඳහන් ලිපිනයේ පිහිටා ඇති ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයෙහි, දෙවන මහලේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලිය යුතුය.

ලංසුපත් භාර ගැනීම 2023.12.06 දින පෙ.ව. 11.00 ට අවසන් වන අතර, එම කාර්යය අවසන් වූ වහාම ලංසුපත් විවෘත කරනු ලැබේ. ලංසුපත් විවෘත කරන අවස්ථාවට සහභාගී වීම සඳහා ලංසුකරුට හෝ බලයලත් නියෝජිතයකුට අවසර දෙනු ලැබේ.

පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම 2023.11.22 දින පෙ.ව. 11.00 ට ප්‍රධාන කාර්යාලයෙහි, දෙවන මහලේ අධ්‍යක්ෂක මණ්ඩල කාමරයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් අවසන් තීරණය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

**සභාපති**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**අංක. 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**

**දුරකථනය - 011 2 880 500**
**(දිගු අංකය - 105)**
E mail : mgr_procurement@slbfe.lk

"එතෙර සවියට - මෙතෙර අත්වැල"